# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 14 දරන
# ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ
# ආයතනය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලද

---

1996 ජූලි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 2.10 යි. තැපැල් ගාස්තුව : රු. 2.25 යි

## 1996 අංක 14 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 45/85

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

වෙනත් කරුණු අතර, ශ්‍රී ලංකාව තුළ වාස්තු විද්‍යාවේ නියුක්ත වන තැනැත්තන් ලියාපදිංචි කිරීමට ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයට හැකි කරනු පිණිස විධිවිධාන සැලසීම අවශ්‍ය වී ඇති හෙයින් ද ;

ඉහත සඳහන් කළ අවශ්‍යතාව ඉටු කිරීමට විධිවිධාන සැලසීම පිණිස ජාතික රාජ්‍ය සභාවේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනතට අවශ්‍ය සංශෝධන කරන ලෙස එකී ආයතනය විසින් ඉල්ලා ඇති හෙයින් සහ ඒ සංශෝධන කිරීම අවස්ථානුකූල වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඩු නාමය.

1. මේ පනත 1996 අංක 14 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1976 අංක 1 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ "ආයතනයේ සාමාජිකයන්ගේ" යන වචන ඉවත් කොට, ඒ වෙනුවට, "ආයතනයේ සාමාජිකයන්ගේ හා ආයතනයේ සාමාජිකයන් නොවන, වාස්තු විද්‍යාඥයන්ගේ සහ වාස්තු විද්‍යා ආවසරික සහතිකපත්‍රලාභීන්ගේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> "(ඊඊ) ආයතනයේ සාමාජිකයන් නොවන, මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති වාස්තු විද්‍යාඥයන්ට හා වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභීන්ට විරුද්ධව වෘත්තීය විෂයමාචාරය පිළිබඳව වූ පැමිණිලි විභාග කිරීම පිණිස විමර්ශන කමිටු සහ විනය කමිටු පත් කිරීමේ ; ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4අ යනුවෙන් අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර, ඒ වගන්තිය එහි 4අ වන වගන්තිය ලෙස බලපවත්වන්නේ ය :—

"වෘත්තීය අභිධාන භාවිතය සීමා කිරීම.

4අ. (1) 12 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ වගන්තිය බලාත්මක වූ අවස්ථාවේ සිට එක් අවුරුද්දක් ඉකුත් වීමෙන් පසු, යම් තැනැත්තකු මේ පනතේ විධිවිධානවලට අනුකූලව

2 — ඩී 039852 — 6,130 (96/05)

වරලත් වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියකු ලෙස විධිමත් පරිදි ලියාපදිංචි වී නොමැති නම් මිස, වරලත් වාස්තු විද්‍යාඥයකුගේ හෝ වාස්තු විද්‍යාඥයකුගේ හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකුගේ වෘත්තීය අභිධානය ගැනීම හෝ භාවිත කිරීම හෝ නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ වරලත් වාස්තු විද්‍යාඥයකු වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු ලෙස ලියාපදිංචි වී නොමැති කිසිම තැනැත්තකු විසින්, වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු, නැතහොත් වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියකු වශයෙන් සපයන ලද වෘත්තීය සේවා වෙනුවෙන් යම් ගාස්තුවක් අයකර ගැනීම සඳහා මේ පනත බලාත්මක වූ අවස්ථාවේ සිට එක් අවුරුද්දක් ඉකුත් වීමෙන් පසු යම් අධිකරණයක යම් නඩුවක් පැවරීමට හෝ පවත්වාගෙන යාමට හිමිකම් නොලබන්නේය ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "උප ලේඛනයෙහි" යන වචනය වෙනුවට "අ උපලේඛනයෙහි" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.*

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "සභාව විසින්, මේ වගන්තියේ" යන වචන වෙනුවට "(4අ) උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, සභාව විසින් මේ වගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) (අ) සාමාජිකයකුට විරුද්ධව හෝ සාමාජිකයකු නොවන වාස්තු විද්‍යාඥයකුට හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකුට විරුද්ධව, වෘත්තීය විෂමාචාරය පිළිබඳ චෝදනාවක් නගා ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාට, වාස්තු විද්‍යාඥයාට හෝ වාස්තුවිද්‍යා ආවසරික සහතිකලාභියාට විරුද්ධව වෘත්තීය විෂමාචාරය පිළිබඳ චෝදනාවක් බැලු බැල්මට පෙනෙන පරිදි තහවුරු වී ඇත්තේද යන්න ගැන විභාග කර බලා සභාවට වාර්තා කිරීම පිණිස සභාව විසින් විමර්ශන කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාට, වාස්තු විද්‍යාඥයාට හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියාට විරුද්ධව වෘත්තිය විෂමාචාරය පිළිබඳ චෝදනාවක් බැලූ බැල්මට පෙනෙන පරිදි තහවුරු වී නොමැති බව (අ) ඡේදය යටතේ පත් කරන ලද විමර්ශන කමිටුවක් විසින් වාර්තා කරනු ලැබූ අවස්ථාවක, ඒ පැමිණිල්ල ගැන සභාව විසින් තවදුරටත් ක්‍රියා නොකළ යුතු ය.

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාට වාස්තු විද්‍යාඥයාට හෝ වාස්තුවිද්‍යා ආවසරික සහතිකලාභියාට විරුද්ධව විෂමාචාරය පිළිබඳ චෝදනාවක් බැලූ බැල්මට පෙනෙන පරිදි තහවුරු වී ඇති බව (අ) ඡේදය යටතේ පත් කරන ලද විමර්ශන කමිටුවක් විසින් සභාවට වාර්තා කර ඇති සහ —

(i) ඒ විෂමාචාරය ඉතා සුළු වන ස්වභාවයේ වූ විෂමාචාරයක් බව ඒ කමිටුව විසින් සභාවට වාර්තා කර ඇති අවස්ථාවක කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාට, වාස්තු විද්‍යාඥයාට හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියාට සභාව විසින් අවස්ථාවක් සලසා දීමෙන් පසු සහ ඒ සාමාජිකයා වාස්තු විද්‍යාඥයා හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියා විසින් ඒ කරුණ විනය පිළිබඳ කමිටුවකට යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබ තිබේ නම් මිස, ඔහු සාමාජිකයකු නම් සභාව විසින් ඔහුට තරයේ අවවාද කළ යුතු ය ; නැතහොත් ඔහු වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු හෝ නම් වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය වෙත ඒ කරුණු යොමු කළ යුතු ය;

(ii) විෂමාචාරය බරපතල ස්වභාවයේ වූ විෂමාචාරයක් බව ඒ කමිටුව විසින් සභාවට වාර්තා කර ඇති අවස්ථාවක, චෝදිත විෂමාචාරය පිළිබඳව විභාග කර බලා සභාවට වාර්තා කිරීම පිණිස සභාව විසින් විනය කමිටුවක් පත් කළ යුතු ය. ".

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5අ) සභාව විසින් පත්කරන ලද විනය කමිටුවක් විසින් පිළිවෙල කරනු ලබන වාර්තාවක්, ආයතනයේ සාමාජිකයකු නොවන වාස්තු විද්‍යාඥයකුට හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකුට අදාළ වන අවස්ථාවක ඒ වාර්තාව, වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සභාව විසින් සැලැස්විය යුතු ය" ;

(4) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) (අ) විනය කමිටුවක් හෝ විමර්ශන කමිටුවක් හෝ විසින් එලෙස වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබුවේ යම් සාමාජිකයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහනිකලාභියකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා, වාස්තු විද්‍යාඥයා නැතහොත් වාස්තු විද්‍යා ආවසරික සහනිකලාභියා විසින්, එම වාර්තාවට විරුද්ධව හෝ එම වාර්තාව සම්බන්ධයෙන් සභාවේ හෝ වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ තීරණයට විරුද්ධව හෝ අභියාචනාධිකරණය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(ආ) එවැනි සෑම අභියාචන පෙත්සමක්ම ලියවිල්ලකින් විය යුතු අතර, රුපියල් දහයක මුද්දරයක් ඇරිය යුතු ය. තමා විශ්වාස තබන නීතිය පිළිබඳ කරුණු දක්වා එහි වග උත්තරකරුවන් වශයෙන් ආයතනය හෝ වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය හෝ නම්කර තිබිය යුතු ය. තවද අවස්ථාවෝචිත පරිදි සභාවේ හෝ වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයේ හෝ තීරණය දක්වා දින විසිඑකක් ඇතුළත දී, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබිය යුතු ය. එය අභියාචනාධිකරණය අවශ්‍ය යයි සලකන පරීක්ෂණයකින් පසුව, අභියාචනාධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ, 8ආ, 8ඇ, 8ඈ, 8ඉ, 8ඊ, 8උ, 8ඌ සහ 8එ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති ඇතුළත් කරන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 8අ, 8ආ, 8ඇ, 8ඈ, 8ඉ, 8ඊ, 8උ, 8ඌ සහ 8එ වන වගන්ති වශයෙන් බලාත්මක වන්නේ ය :—

''වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය.

'8අ. (1) වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් ඇති සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් වන අතර, එහි සංස්ථාගත නාමයෙන් එය විසින් නඩු පැවරීමට සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීමට හැකි ය.

(3) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය :—

(අ) වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී තෝරා පත් කරගත යුතු ආයතනයේ හිටපු සභාපතිවරයෙක් ; ඔහු මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය;

(ආ) සභාව විසින් නම් කරනු ලබන ආයතනයේ සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නම් කරන ලද වරලත් වාස්තු විද්‍යාඥයෙක් ;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය විසින් නම් කරන ලද වරලත් වාස්තු විද්‍යාඥයෙක් ;

(ඉ) සභාව විසින් නම් කරනු ලබන, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලයක වාස්තු විද්‍යා පීඨයේ මහාචාර්යවරයෙක් ;

(ඊ) 1957 අංක 40 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන ආයතනයේ සභාපතිවරයා ;

(උ) රාජ්‍ය අංශයේ සේවයේ නියුක්ත සංස්ථාගත සාමාජිකයන් අතුරින් නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද, ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් තුන් දෙනෙක් ;

(ඌ) වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභීන් විසින් තෝරා පත් කර ගත් වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභීන්ගේ නියෝජිතයෙක්.

(4) සභාපතිවරයා සහ අවස්ථාවෝචිත පරිදි, නම් කරන ලද හෝ තෝරාපත් කර ගනු ලබන සාමාජිකයන්, අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධූර දැරිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි එම සභාපතිවරයා හෝ සාමාජිකයා හෝ මණ්ඩලයේ ධූරය දැරීම අවසන් කර එක් අවුරුද්දක කාලසීමාවක් ගතවීමෙන් පසුව නැවත නම් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(5) මණ්ඩලයේ සභාපතිවරයා විසින් තමා පැමිණ සිටින, මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරගනු ලබන යම් සාමාජිකයකු, ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(6) (අ) මණ්ඩලයේ සාමාජිකයකු මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණීම නිසා හෝ මාස හයකට වැඩි කාලසීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලා අස්වීමෙන් ලිපියක් භාරදෙන ලද විට හෝ ආයතනයේ සාමාජිකයකු වීම නිසා මණ්ඩලයට නම් කරන ලද හෝ තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයකු සම්බන්ධයෙන් වන විට, ඔහු ආයතනයේ සාමාජිකයකු වීම අවසන්වීම නිසා හෝ, රාජ්‍ය අංශයේ සේවයෙහි නියුක්ත වී සිටීම නිසා මණ්ඩලයට නම් කරනු ලැබූ සාමාජිකයකු සම්බන්ධයෙන් වන විට, ඔහු රාජ්‍ය අංශයේ සේවයෙහි නියුක්ත වීම අවසන් වීම නිසා හෝ ඔහුගේ ධුරය හිස් වන්නේ ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි තෝරා පත් කරගනු ලැබූ හෝ නම් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකුගේ මරණය සිදු වූ විට හෝ ඔහුගේ ධුරය හිස් වූ විට, ඒ සාමාජිකයා වෙනුවට, වෙනත් තැනැත්තකු (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව අවස්ථාවෝචිත පරිදි තෝරාපත් කිරීම හෝ නම් කිරීම කළ යුතු අතර, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ඔහු විසින් ධුරය දැරිය යුතු ය ;

(ඇ) අනුගාමී රැස්වීම් දෙකක් අතර කාල පරතරය මාස තුනකට වැඩි නොවන ආකාරයට මණ්ඩලය එක් එක් ලිත් වර්ෂයක දී යටත් පිරිසෙයින් හය වතාවක්වත් රැස්විය යුතු ය ;

(ඈ) යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු වන්නේ ය;

(ඉ) සභාපතිවරයාගේ විධානය මත හෝ රැස්වීමක් කැඳවීම පිණිස සාමාජිකයන් තිදෙනකට නොඅඩු සංඛ්‍යාවක් විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් මණ්ඩලයේ රැස්වීම් කැඳවිය යුතු ය ;

(ඊ) මණ්ඩලයේ යම් රැස්වීමක දී උද්ගත වන යම් ප්‍රශ්නයක් පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, ඡන්දය එක හා සමාන වූ විට, සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට දෙවන හෝ තීරක ඡන්දයක් ඇත්තේ ය ;

(උ) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ අවස්ථාවෝචිත පරිදි, යම් සාමාජිකයකු තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් හෝ නම් කිරීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ රැස්වීම් කටයුත්තක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(7) (අ) සභාව විසින් මණ්ඩලයේ රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු මණ්ඩලයේ ලේකම්වරයා වන්නේ ය;

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු පිළිබඳ වාර්තා තබාගත යුතු ය.

(8) මෙහි ඇතුළත් වන විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් හා ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් තම ක්‍රියාපටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කළ හැකි ය.

මණ්ඩලයේ කර්තව්‍ය හා බලතල.

8ආ. (අ) වරලත් වාස්තු විද්‍යාඥයන් හෝ වාස්තු විද්‍යා ආවසථික සහතික ලාභීන් ලෙස ලියාපදිංචි කරනු ලැබීමට මේ පනත යටතේ සුදුසුකම් ලබා ඇති තැනැත්තන් එලෙස ලියාපදිංචි කිරීම ;

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ලියාපදිංචි කිරීම් අත්හිටුවීම, අවලංගු කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම ;

(ඇ) වරලත් වාස්තු විද්‍යාඥයන්ගේ, වාස්තු විද්‍යාඥයන්ගේ හා වාස්තු විද්‍යා ආවසථික සහතික ලාභීන්ගේ විස්තර ලේඛනයක් පවත්වා ගෙන යාම සහ පළ කිරීම

මණ්ඩලයේ කර්තව්‍ය වන්නේ ය.

වරලත් වාස්තු විද්‍යාඥයන්ගේ වාස්තු විද්‍යාඥයන්ගේ හා වාස්තු විද්‍යා සහතික ආවසරික ලාභීන්ගේ විස්තර ලේඛනය.

8 ඈ. (1) මණ්ඩලයේ පළමුවන රැස්වීමේ දිනයේ සිට මාස හයක් පසුවීමට පෙර, මණ්ඩලයේ විධානවලට යටත්ව, රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ පනත යටතේ අවශ්‍යාවෝචිත පරිදි වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු ලෙස ලියාපදිංචි කරනු ලබන සෑම තැනැත්තකුගේම නම සහ මේ පනත යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා පිළිගෙන ඇති සෑම ආයතනයකම නම ඇතුළත් කොට—

(අ) වරලත් වාස්තු විද්‍යාඥයන්ගේ ;

(ආ) වාස්තු විද්‍යාඥයන්ගේ ;

(ඇ) වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභීන්ගේ සහ

(ඈ) ලියාපදිංචි කිරීමේ කාර්යයන් සඳහා සුදුසුකම් පිළිගෙන ඇත්තේ යම් ආයතනවල ද ඒ ආයතනවල

විස්තර ලේඛනයක් මෙහි 'ආ' උපලේඛනයේ දැක්වෙන ආකෘතියේ සාරානුකූලව පිළියෙළ කළ යුතු ය.

(2) එසේ පිළියෙල කරන ලද විස්තර ලේඛනවල පිටපත්, මණ්ඩලයේ ප්‍රථම රැස්වීමෙන් පසු එක් අවුරුද්දක් ගත වීමට පෙර ද ඉන්පසු වර්ෂයක් පාසා ද ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(3) යම් අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී—

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකුගේ නම වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියකු ලෙස ලියාපදිංචි කරනු ලැබ තිබෙන බව හෝ නොතිබෙන බව සඳහන් වන විස්තර ලේඛනයකින් ලබා ගත් යම් උද්ධෘතයක් හෝ පිටපතක් ; හෝ

(ආ) යම් තැනැත්තකුගේ නම වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු ලෙස ලියාපදිංචි කර තිබෙන බව හෝ නොතිබෙන බව සඳහන් කරමින් රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සනින් යුක්තව නිකුත් කරන ලද සහතිකයක් එහි සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන අතර, අත්සන පිළිබඳ ඔප්පු කිරීමකින් තොරව සාක්ෂියක් වශයෙන් එය පිළිගනු ලැබිය යුතු ය.

8ඇ. (1) සභාව විසින්, වරලත් වාස්තු විද්‍යාඥයන්, වාස්තු විද්‍යාඥයන් හා වාස්තු විද්‍යා ආවසපික සහතික ලාභීන් ලෙස ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර ද එසේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් හා ඒ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ද නියම කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ ගාස්තු

(2) ඉහත සඳහන් විධිවිධාන යටතේ නියම කරනු ලබන සෑම ගාස්තුවක්ම සභාවේ ගරු භාණ්ඩාගාරිකවරයා වෙත ගෙවිය යුතු ය. මණ්ඩලය විසින් මේ පනත යටතේ තම බලතල, කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීමේ දී සහ කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද වියදම් ගෙවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල්, මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් සභාවේ ගරු භාණ්ඩාගාරිකවරයා වෙත ඉල්ලීමක් කර ඉදිරිපත් කරන ලද විට, සභාවේ ගරු භාණ්ඩාගාරිකවරයා විසින් සභාවේ අනුමතයට යටත්ව, මණ්ඩලය වෙත ගෙවිය යුතු ය.

8ඉ. (1) කිසිම තැනැත්තකු—

වරලත් වාස්තු විද්‍යාඥයන් වාස්තු විද්‍යාඥයන් හා වාස්තු විද්‍යා ආවසපික සහතික ලාභීන් ලෙස ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම්.

(අ) ඒ තැනැත්තා, ආයතනයේ සංස්ථාගත සාමාජිකයකු වේ නම් මිස, වරලත් වාස්තු විද්‍යාඥයකු ලෙසද ; හෝ

(ආ) ඒ තැනැත්තා—

(i) ආයතනයේ සංස්ථාගත නොකළ ලියාපදිංචි සාමාජිකයකු ; හෝ

(ii) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ විභාගයේ II වන කොටසෙන් සමත්ව නියමිත කාල සීමාව සඳහා ප්‍රායෝගික පළපුරුද්ද ලබාගෙන ඇත්තා වූ සහ වාස්තු විද්‍යාඥයකු ලෙස ලියාපදිංචිවීම සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගයෙන් සමත් වී සිටින තැනැත්තකු ; හෝ

(iii) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලයකින් ප්‍රදානය කරන්නා වූ ද, ඒ විශ්ව විද්‍යාලයෙන් සලසා දෙනු ලබන වාස්තු විද්‍යාව පිළිබඳ

ශාස්ත්‍රීය තත්වයන් සහ පුහුණුව සැලකිල්ලට ගෙන ආයතනය විසින් මේ වගන්තියේ කාර්ය සඳහා පිළිගනු ලබන්නා වූ ද, වාස්තු විද්‍යා විද්‍යාපති උපාධියක් හෝ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද වාස්තු විද්‍යා අධ්‍යාපන මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන ඊට සමාන සුදුසුකමක් හෝ ලබාගෙන, නියමිත කාලසීමාව සඳහා ප්‍රායෝගික පළපුරුද්ද ඇතිව සහ වාස්තු විද්‍යාඥයකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගයෙන් සමත් වී සිටින තැනැත්තකු ; හෝ

(iv) මෙහි "ආ" උපලේඛනයේ සඳහන් කර ඇති අධ්‍යාපන ආයතනයකින් හෝ වෘත්තීය ආයතනයකින් වාස්තු විද්‍යාව පිළිබඳ වෙනත් යම් අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් ලබාගෙන සිටින සහ නියමිත කාලසීමාව සඳහා ප්‍රායෝගික පළපුරුද්ද ලබා ගෙන, වාස්තු විද්‍යාඥයකු ලෙස ලියාපදිංචි වීමේ කාර්ය සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගයෙන් සමත් වී සිටින තැනැත්තකු නම් විස,

වාස්තු විද්‍යාඥයකු ලෙස ද ;

(ආ) ඒ තැනැත්තා—

(1) නියමිත කාලසීමාව සඳහා වාස්තු විද්‍යාඥයකුගේ තත්ත්වයෙන් ප්‍රායෝගික පළපුරුද්ද තිබෙන ආයතනයේ උපාධිධාරී සාමාජිකයකු වී සහ වාස්තු විද්‍යාඥයකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගයෙන් සමත් වී සිටින තැනැත්තකු ; හෝ

(ii) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ විභාගයේ I වන කොටසින් සමත්ව නියමිත කාල සීමාව සඳහා ප්‍රායෝගික පළපුරුද්ද ලබාගෙන සිටින සහ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභීන් ලෙස ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගයෙන් සමත් වී සිටින තැනැත්තකු ; හෝ

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලැබූ විශ්ව විද්‍යාලයයක් වන්නා වූ ද, ඒ විශ්ව විද්‍යාලය මගින් සපයනු ලබන වාස්තු විද්‍යා පිළිබඳ ශාස්ත්‍රීය තත්ත්වය හා පුහුණුව සැලකිල්ලට ගෙන, මේ වගන්තියේ කාර්ය සඳහා ආයතනය . විසින් පිළිගනු ලැබුවා වූ ද, එකී විශ්ව විද්‍යාලයෙන් වාස්තු විද්‍යාව පිළිබද විද්‍යාවේදී උපාධිය ලබාගත් තැනැත්තකු හෝ ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත යටතේ පිහිටු වන ලද වාස්තු විද්‍යා අධ්‍යාපන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ඊට සමාන සුදුසුකම් ලබාගෙන නියමිත කාලසීමාව සඳහා ප්‍රායෝගික පළපුරුද්ද ලබාගෙන සහ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගය සමත්වී සිටින තැනැත්තකු ; හෝ

(iv) මෙහි 'ආ' උපලේඛනයේ සඳහන් කර ඇති අධ්‍යාපන ආයතනයකින් හෝ වෘත්තීය ආයතනයකින් වාස්තු විද්‍යාව පිළිබද වෙනත් යම් අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් ලබාගෙන සිටින සහ නියමිත කාලසීමාව සඳහා වාස්තු විද්‍යාවට සම්බන්ධ තත්ත්වයෙන් ප්‍රායෝගික

පළපුරුද්ද ලබාගෙන, වාස්තු විද්‍යා ආචාසරික සහතික ලාභියකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාග යෙන් සමත් වී සිටින තැනැත්තකු ; හෝ

(v) නියමිත කාලසීමාවට නොඅඩු කාල සීමාවක් තුළ ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක වාස්තු විද්‍යාවේ නියුක්තව සිටි බවට සහ වාස්තු විද්‍යා ආචාසරික සහතික ලාභීන් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා සභාව විසින් පවත්වනු ලබන වෘත්තීය ප්‍රායෝගික විභාගයෙන් සමත් වී සිටින තැනැත්තකු

නම් මිස, වාස්තු විද්‍යා ආචාසරික සහතික ලාභියකු ලෙසද, ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

8ඊ. (1) යම් තැනැත්තකු—

(අ) වයස අවුරුදු විසි එක සම්පූර්ණ කර නොමැති නම් ;

(ආ) ශ්‍රී ලංකා පුරවැසියකු නොවේ නම් ;

(ඇ) නිසි බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ සිටී නම් ;

(ඈ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් රටක නිසිබලය ඇති අධිකරණයක් විසින් බංකොලොත් හෝ වස්තු භංගත්වයට පත්වී ඇති බවට විනිශ්චය කරනු ලැබ, ඔහුගේ බංකොලොත්භාවය හෝ වස්තු භංගත්වය මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් උද්ගත වී ඇත්තේ වැළැක්විය නොහැකි පාඩුවක් හෝ අභාග්‍යයක් නිසා බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් සහතිකයක් දී නොමැති නම් ; හෝ

(ඉ) බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් පැමිණ විය හැකි හෝ ඒ හා සමාන දඬුවම් පැමිණ විය හැකි, චරිත දූෂණය හා සම්බන්ධ යම් වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් රටක නිසි බලය ඇති අධිකරණයක් විසින්, වරද

කරු කරනු ලැබ, ඒ සම්බන්ධයෙන් සමාවක් දී නොමැති නම් ඒ තැනැත්තා වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හිමිකම් නොලබන්නේය.

(2) ලියාපදිංචි කිරීම සඳහා යම් ඉල්ලීමක් ලැබීමෙන් පසු එක් මාසයකට නොවැඩි කාලසීමාවක් ඇතුළත, ඒ ඉල්ලීම ගැන මණ්ඩලය විසින් තීරණයක් ගත යුතු අතර, එම තීරණය ගැනීමෙන් පසු එක් මාසයක් ඇතුළත දී ඉල්ලුම්කරුට එම තීරණය, ඊට හේතුද සමග, දන්වා සිටිය යුතු ය.

8උ. (1) (අ) ලියාපදිංචි වීමට යම් තැනැත්තකුට හිමිකම් ලැබුණේ යම් සුදුසුකම් මත ද, ඒ සුදුසුකම් ඔහුට අහිමි වුවහොත් ;

විස්තර ලේඛනයෙන් නම ඉවත් කිරීම.

(ආ) 8ඊ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් නුසුදුසුකමකට ඒ තැනැත්තා යටත් වුවහොත් ;

(ඇ) ඒ තැනැත්තා වංචාවකින් හෝ සාවද්‍ය ලෙස කරුණු ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචි වී තිබුණහොත් ;

(ඈ) ඒ තැනැත්තා ආයතනයේ සාමාජිකයකු වන අවස්ථාවක, ඔහුගේ නම 8 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ විස්තර ලේඛනයෙන් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ

(ඉ) ඒ තැනැත්තා ආයතනයේ සාමාජිකයකු නොවන අවස්ථාවක, ඔහු මේ පනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විමර්ශන කමිටුවක් හෝ විනය කමිටුවක් මගින් පවත්වනු ලබන නිසි විභාගයකින් පසු වෘත්තීය විෂමාචාරය පිළිබඳ වරදක් කර ඇති බව තීරණය කරනු ලැබුවහොත්, සහ විමර්ශන කමිටුවෙහි හෝ විනය කමිටුවෙහි තීරණයට විරුද්ධව අභියාචනයක් කර නොමැති නම්

අදාළ විස්තර ලේඛනයෙන් ඒ තැනැත්තාගේ නම ඉවත් කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) මණ්ඩලයේම කැමැත්ත මත හෝ (අ) හෝ (ඉ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් තත් කාර්ය සඳහා ඉල්ලීමක් කරන ලද විට, සභාව විසින් කරනු ලබන නිර්දේශයක් මත, ඒ තැනැත්තාගේ ලියාපදිංචි කිරීම මණ්ඩලය විසින් ප්‍රතිස්ථාපනය කළ හැකි ය.

(3) මේ පනතේ 8 වන වගන්තියේ (3) උප වගන්තියේ අතුරු විධානය යටතේ යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබ ඇති අවස්ථාවක, අත්හිටුවීමේ කාලසීමාව පෙන්නුම් කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් තබා ගත යුතු සහ පවත්වාගෙන යායුතු අදාළ විස්තර ලේඛනයක ඒ තැනැත්තාගේ නම ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(4) ඒ අත්හිටුවීම මහජනයා වෙත දැනුම් දීම ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සභාව සලකනු ලබන අවස්ථාවක, ඒ බව සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් පළවන යම් ජාතික පුවත්පතක පළ කිරීමට සභාව විසින් සැලැස්විය හැකි ය.

විස්තර ලේඛන පවත්වාගෙන යාම.

8ඌ. (1) ලියාපදිංචිවීමට යම් වරලත් වාස්තු විද්‍යාඥයකුට, වාස්තු විද්‍යාඥයකුට හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකුට හිමිකම ලැබුණේ යම් සුදුසුකම් මත ද ඒ සුදුසුකම් ඒ වරලත් වාස්තු විද්‍යාඥයාට, වාස්තු විද්‍යාඥයාට හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියාට අහිමි වූ අවස්ථාවක හෝ 8ඊ වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් නුසුදුසුකම්වලට ඔහු යටත් වූ අවස්ථාවක, ඒ බව වහාම රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්වීම ඒ වරලත් වාස්තු විද්‍යාඥයාගේ, වාස්තු විද්‍යාඥයාගේ හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියාගේ යුතුකම වන්නේය. එවිට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ බව මණ්ඩලය වෙත දන්වා සිටිය යුතු ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචිවී සිටින වරලත් වාස්තු විද්‍යාඥයකුගේ, වාස්තු විද්‍යාඥයකුගේ හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකුගේ ව්‍යාපාරික ස්ථානය හෝ වාසස්ථානය වෙනස් වුවහොත් ඒ බව වහාම රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම්දීම ඒ වරලත් වාස්තු විද්‍යාඥයාගේ, වාස්තු විද්‍යාඥයාගේ හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියාගේ යුතුකම වන අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් අලුත් ලිපිනය අදාළ විස්තර ලේඛනයේ ඇතුළත් කළ යුතු ය.

(3) සෑම වරලත් වාස්තු විද්‍යාඥයකුගේ, වාස්තු විද්‍යාඥයකුගේ හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියකුගේ නම—

(අ) ඔහු මිය ගිය විට ;

(ආ) රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලබන ලිඛිත ඉල්ලීමකින් තමාගේ නම ඉවත් කරන ලෙස ඉල්ලූ විට ;

(ඇ) වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව, ඒ ගාස්තුව ගෙවිය යුතු වූ දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත ගෙවීම ඔහු පැහැර හැරිය විට

අදාළ විස්තර ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද නොගෙවා පැහැර හරින මුදල ගෙවන ලද විට, මණ්ඩලය විසින් තම අභිමතය පරිදි, ඒ වරලත් වාස්තු විද්‍යාඥයාගේ, වාස්තු විද්‍යාඥයාගේ හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියාගේ නම අදාළ ලේඛනයේ නැවත ඇතුළත් කළ හැකි ය.

මණ්ඩලයේ තීරණවලට විරුද්ධව අභියාචනා

8අ. (1) යම් තැනැත්තකු වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියකු වශයෙන් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසරික සහතික ලාභියකු වශයෙන් වූ යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අත්හිටුවමින් හෝ අවලංගු කරමින් මණ්ඩලය විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකි ය.

(2) එවැනි සෑම අභියාචනයක්ම ලියවිල්ලකින් විය යුතු අතර ඒ සඳහා ආධාර කර ගනු ලබන නෛතික කරුණු සඳහන් කර මණ්ඩලය එහි වග උත්තරකරු වශයෙන් නම් කර මණ්ඩලයේ තීරණය දැනුම් දෙනු ලැබූ දිනයේ සිට දින විසි එකක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (ආ) ඡේදයේ " ලංකා " යන වචනය වෙනුවට, " ශ්‍රී ලංකා " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය ලෙස බලාත්මක වන්නේය :—

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ භාරකාර මණ්ඩලය.

11අ. (1) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම පිණිස, සභාවේ තත් කාලයේ සභාපතිවරයාගෙන්, ජ්‍යෙෂ්ඨ උපසභාපතිවරයාගෙන්, ගරු ලේකම්වරයාගෙන් සහ ගරු භාණ්ඩාගාරිකවරයාගෙන් ද, සභාවේ ඊට පෙරාතුවම සිටි සභාපතිවරයාගෙන් ද සමන්විත වූ (මෙහි මින් මතු "භාරකාර මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයක් ආයතනයේ භාරකාර මණ්ඩලය ලෙස මෙයින් පිහිටුවනු ලැබේ.

(2) භාරකාර මණ්ඩලය "ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ භාරකාර මණ්ඩලය" යන නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර ඒ නමින් එය විසින් නඩු පැවරීමට හා ඊට විරුද්ධව නඩු පවරනු ලැබීමට පූර්ණ බලය ඇත්තේය.

(3) භාරකාර මණ්ඩලයට

(අ) ආයතනයේ යහපත සඳහා, යම් නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලී යට ගැනීමේ හෝ දීමේ, උකස් කිරීමේ, ඔඩපනය කිරීමේ, විකිණීමේ හා හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් අන්සතු කිරීමේ, බැඳීමකට යටත් කිරීමේ හෝ බැහැර කිරීමේ ;

(ආ) ආයතනයේ යහපත සඳහා භාරයේ මුදල් ආයෝජනය කිරීමේ සහ ආයතනයේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ, සාමාජිකයන්ගේ හා ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ යහපත සඳහා අර්ථලාභ යෝජනා ක්‍රම, සුභ සාධක යෝජනා ක්‍රම නිවාස යෝජනා ක්‍රම, රක්ෂණ යෝජනාක්‍රම සහ වෙනත් සමාජ සේවා යෝජනා ක්‍රම පිහිටුවීම පිණිස ඒ මුදල් යෙදවීමේ ;

(ඇ) පුස්තකාල සහ වාස්තු විද්‍යා ලේඛනාගාරයක් පිහිටුවීම හා පවත්වා ගෙන යාමේ බලය ඇත්තේ ය.

(4) මේ වගන්තිය බලාත්මක වන දිනයට පෙරටුව ම වූ දිනයේ ආයතනය විසින් දරන ලද සියලුම දේපළ, මේ වගන්තිය බලාත්මක වන දිනයේ සිට, භාරකාර මණ්ඩලයට පැවරෙන අතර, ඒ භාරකාර මණ්ඩලය විසින් ඒ දේපළ ආයතනයේ යහපත සඳහා දැරිය යුතු ය.

(5) මේ වගන්තිය බලාත්මක වන අවස්ථාවේ සිට සහ ඉන්පසු, ආයතනය විසින් -

(අ) 4 වන වගන්තියේ (අ) ඡේදයෙන් ආයතනය වෙත පැවරී ඇති බලතල, ඒ බලතල නිශ්චල දේපළවලට අදාළ වන තාක් දුරට

(ආ) 4 වන වගන්තියේ (ඇ) ඡේදයෙන් ආයතනය වෙත පැවරී ඇති බලතල, ඒ බලතල මුදල් ආයෝජනය කිරීමට අදාළ වන තාක් දුරට

ක්‍රියාත්මක කිරීම නතර කළ යුතු ය.

(6) (අ) භාරකාර මණ්ඩලයේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත්පත් තබා ගැනීමට භාරකාර මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(ආ) භාරකාර මණ්ඩලයේ ගිණුම් ඒ මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් ලවා විගණනය කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද පුද්ගලයකු ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම පිණිස එකී ආයතනයේ

සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද එවැනි වරලත් ගණකාධිකාරීන්ගේ ව්‍යාපාර ආයතනයක්

අදහස් වේ.

(7) මේ වගන්තියේ විධිවිධාන 1996 සැප්තැම්බර් මස 25 වන දින සිට බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"අභිධාන හා වෘත්තීය භාවිතය පිළිබඳ සීමා"

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "වාස්තු විද්‍යාඥයන්ගේ" යන වචන අත්හැර දැමීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(8අ) ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් හෝ මේ පනත යටතේ ලියාපදිංචි වාස්තු විද්‍යාඥයන් හෝ මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තන් හෝ තත්කාලයේ බලපවත්නා කිසියම් නීතියක් යටතේ ඉංජිනේරුවන්, ක්‍රම සැළසුම්කරුවන් සහ වෙනත් වෘත්තිකයන් ලෙස ලියාපදිංචි තැනැත්තන් විසින්, යම් පෞද්ගලික සමාගමක් පිහිටුවීමට සභාව විසින් අවසර දෙනු ලැබිය හැකි ය. තත්කාලයෙහි බලපවත්නා එම සමාගමේ සාංගමික සංස්ථාපත්‍රයෙන් හෝ ව්‍යවස්ථාවලියෙන් එම සමාගමේ සියලු අධ්‍යක්ෂවරයන් ද, ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ද, මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තන් විය යුතු බවට හෝ ඉංජිනේරුවන්, ක්‍රම සැළසුම්කරුවන් හෝ වෙනත් නියමිත වෘත්තිකයන් ලෙස ලියාපදිංචි තැනැත්තන් එම සමාගමේ විස්තරයෙහි කොටසක් වශයෙන්, අවස්ථාවෝචිත පරිදි "වරලත් වාස්තු විද්‍යාඥයන්" හෝ "වාස්තු විද්‍යාඥයන්" හෝ "වරලත් වාස්තු විද්‍යාඥයන්" සහ ඉංජිනේරුවන් හෝ "වාස්තු විද්‍යාඥයන් සහ ඉංජිනේරුවන්" යන අභිධානය ගත යුතු බවට සහතික විය යුතු ය. (එසේ වුවද එම සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින් එම සමාගමේ සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය සහ ඊට කරන ලද යම් සංශෝධන සමග එම සමාගමේ තත් කාලයෙහි සිටින සියලු අධ්‍යක්ෂවරයන් විසින්, තමන් ආයතනයේ වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයට අනුව ක්‍රියා කරන බවට වාර්ෂිකව කරනු ලබන ප්‍රකාශයක් ආයතනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තවද අධ්‍යක්ෂවරයකු නැතහොත් කොටස් හිමියකු

ලෙස වෘත්තියේ යෙදීමට යථා පරිදි සුදුසුකම් සහ අයිතිය ඇති එක් එක් අධ්‍යක්ෂවරයා සහ කොටස් හිමියා විසින්, මේ වගන්තියේ විධිවිධාන යටතේ තමාට ගැනීමට සහ පාවිච්චි කිරීමට අයිතිය ඇති අභිධානය සහ මුල් අකුරු තම නාමයට ඉදිරියෙන් යොදා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.".

(4) ඒ වගන්තියේ (4) වන උප වගන්තිය ප්‍රත්‍යාදිෂ්ට කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර කිසිම තැනැත්තකු, ව්‍යාපාර ආයතනයක්, පුද්ගල මණ්ඩලයක් හෝ සමාගමක් විසින් "වරලත් වාස්තු විද්‍යාඥයා", "වරලත් වාස්තු විද්‍යාඥයින්", "වාස්තු විද්‍යාඥයා", "වාස්තු විද්‍යාඥයින්", "වාස්තු විද්‍යා ආවසථික සහතිකලාභියා", "වාස්තු විද්‍යා ආවසථික සහතික ලාභීන්" යන අභිධානයන් හෝ 'ඇෆ් අයි. ඒ. (ශ්‍රී ලංකා) හෝ ඒ. අයි. ඒ. (ශ්‍රී ලංකා)' යන මුලකුරු හෝ ඒවායේ යම් කෙටි යෙදුමක් හෝ ඊට සමාන යෙදුමක්, ඊට යම් එකතු කිරීමක් ඇතිව හෝ නැතිව යම් භාෂාවකින් යෙදීම හෝ භාවිත කිරීම නොකළ යුතු අතර යම් ව්‍යාපාර ආයතනයක ව්‍යාපාරයක, පුද්ගල මණ්ඩලයක හෝ වාස්තු විද්‍යාව පිළිබඳ හෝ වාස්තු විද්‍යා වෘත්තීය සැලසුම් කිරීම හෝ ඒ වෘත්තියේ නියුක්තවීම පිළිබඳ යම් පොතක, සඟරාවක හෝ වෙනත් ප්‍රකාශනයක නම හෝ විස්තරය ලෙස හෝ නමේ හෝ විස්තරයේ කොටසක් ලෙස භාවිත කිරීම ද නොකළ යුතු ය.

(5) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සෑම වරලත් වාස්තු විද්‍යාඥයකුට, වාස්තු විද්‍යාඥයකුට හෝ වාස්තු විද්‍යා ආවසථික සහතිකලාභියකුට, අවස්ථාවෝචිත පරිදි, "වරලත් වාස්තු විද්‍යාඥයා", "වාස්තු විද්‍යාඥයා" හෝ "වාස්තු විද්‍යා ආවසථික සහතිකලාභියා" යන අභිධානය යෙදීමට හෝ භාවිත කිරීමට හිමිකම ඇත්තේ ය.

(6) ව්‍යාපාර ආයතනයක එක් එක් හවුල් ව්‍යාපාරිකයා මේ පනත යටතේ වරලත් වාස්තු විද්‍යාඥයකු, වාස්තු විද්‍යාඥයකු හෝ වාස්තු විද්‍යා ආවසථික සහතිකලාභියකු ලෙස ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ව්‍යාපාර ආයතනයට, අවස්ථාවෝචිත පරිදි "වරලත් වාස්තු විද්‍යාඥයා" "වාස්තු විද්‍යාඥයා" හෝ "වාස්තු විද්‍යා ආවසථික සහතිකලාභියා" යන අභිධානය යෙදීමට සහ භාවිත කිරීමට හිමිකම ඇත්තේ ය.

(7) ව්‍යාපාර ආයතනයක එක් හවුල් ව්‍යාපාරිකයකු හෝ ඊට වැඩි ගණනක් මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද වරලත් වාස්තු විද්‍යාඥයන්, වාස්තු විද්‍යාඥයන් හෝ වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභීන් වන අවස්ථාවක, ඒ ව්‍යාපාර ආයතනයේ ඉතිරි හවුල් ව්‍යාපාරිකයන්, වෙනත් නියමිත වෘත්තීන්හි සාමාජිකයන් වන්නේ නම්, අවස්ථෝචිත පරිදි, "වරලත් වාස්තු විද්‍යාඥයා", "වරලත් වාස්තු විද්‍යාඥයෝ", "වාස්තු විද්‍යාඥයා" "වාස්තු විද්‍යාඥයෝ", "වාස්තු විද්‍යා ආවසරික සහතික පත්‍රලාභියා" හෝ "වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභියෝ" යන අභිධානය ඒ ව්‍යාපාර ආයතනයේ විස්තරයේ කොටසක් ලෙස යෙදීමට සහ භාවිත කිරීමට සභාව විසින් ඒ ව්‍යාපාර ආයතනයට අවසර දිය හැකි ය ;

(8) ව්‍යාපාර ආයතනයක හවුල් ව්‍යාපාරිකයන්, ආයතනයේ සංස්ථාගත නොකළ සාමාජිකයන්ගෙන් මෙන්ම ආයතනයේ ලියාපදිංචි කළ සාමාජිකයන්ගෙන් ද ; වාස්තු විද්‍යා ආවසරික සහතිකලාභීන් එක් අයකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් ද සමන්විත වන අවස්ථාවක, ඒ ව්‍යාපාර ආයතනයේ විස්තරය ලෙස හෝ විස්තරයේ කොටසක් ලෙස "වරලත් වාස්තු විද්‍යාඥයෝ" යන අභිධානය භාවිත නොකළ යුතු ය :

එසේ වුවද, ඒ ව්‍යාපාර ආයතනයේ එක් එක් හවුල් ව්‍යාපාරිකයා විසින්, මේ වගන්තියේ විධිවිධාන යටතේ යෙදීමට හා භාවිත කිරීමට තමාට හිමිකම ඇති අභිධානය සහ මුලකුරු තම නමට එකතු කරනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක" යන වචන වෙනුවට "රුපියල් දස දහසක" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ "උපලේඛනය" යන වචනය වෙනුවට " 'අ' උපලේඛනය" යන වචන ආදේශ කිරීමෙන් උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 'ආ' උපලේඛනය ඇතුළත් කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 'අ' උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 'ආ' උපලේඛනය ලෙස බලපවත්වන්නේ ය :

"ආ" උපලේඛනය (8ඇ සහ 8ඉ වගන්ති)

## I වන කොටස

### වරලත් වාස්තු විද්‍යාඥයන් පිළිබඳ ලේඛනය

| නම | ව්‍යාපාර ලිපිනය | වාසස්ථාන ලිපිනය | වාස්තු විද්‍යා සුදුසුකම් දින සහිතව | ලියාපදිංචි කිරීමේ දිනය |
|---|---|---|---|---|
| | | | | |

## II වන කොටස

### වාස්තු විද්‍යාඥයන් පිළිබඳ ලේඛනය

| නම | ව්‍යාපාර ලිපිනය | වාසස්ථාන ලිපිනය | වාස්තු විද්‍යා සුදුසුකම් දින සහිතව | ලියාපදිංචි කිරීමේ දිනය |
|---|---|---|---|---|
| | | | | |

## III වන කොටස

### වාස්තු විද්‍යා ආචසරික සහතිකලාභීන් පිළිබඳ ලේඛනය

| නම | ව්‍යාපාර ලිපිනය | වාසස්ථාන. ලිපිනය | වාස්තු විද්‍යා සුදුසුකම් දින සහිතව | ලියාපදිංචි කිරීමේ දිනය |
|---|---|---|---|---|
| | | | | |

## IV වන කොටස

**ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා තත්කාලයෙහි සුදුසුකම් පිළිගනු ලබන ආයතන**

**ඕස්ට්‍රේලියාව**

- ගෝර්ඩන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, ගිලෝංග්, වික්ටෝරියා
- හොබාර්ට් ටෙක්නිකල් කොලෙජ්, ටැස්මේනියාව
- නිව් සවුත් වේල්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, සිඩ්නි
- ක්වීන්ස්ලන්ඩ් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, බ්‍රිස්බේන්
- රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, වික්ටෝරියා
- සවුත් ඔස්ට්‍රේලියා ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, ඇඩිලේඩ්
- ඇඩිලේඩ් විශ්ව විද්‍යාලය
- මෙල්බර්න් විශ්ව විද්‍යාලය
- නිව්කාසල් විශ්ව විද්‍යාලය
- නිව්සවුත්වේල්ස් විශ්ව විද්‍යාලය
- ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලය
- සිඩ්නි විශ්ව විද්‍යාලය
- වෙස්ටර්න් ඔස්ට්‍රේලියා, ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, පර්ත්

කැනඩාව

ලා යුනිවර්සිටි ඩි මොන්ට්‍රියල්

ලා යුනිවර්සිටි ලාවල්

මැක්ගිල් යුනිවර්සිටි, මොන්ට්‍රියල්

නෝවාස්කෝෂියා ටෙක්නිකල් කොලේජ්

මැනිටෝබා විශ්ව විද්‍යාලය

ටොරොන්ටෝ විශ්ව විද්‍යාලය

බ්‍රිටිෂ් කොලොම්බියා විශ්ව විද්‍යාලය

ඩෙන්මාර්කය

අර්කිටෙක්ටස්කෝලන්ඩ අයි ආර්හස්

රෝයල් ඩැනිෂ් ඇකඩමි, කෝපන්හේගන්

ඝානා

යුනිවර්සිටි ඔෆ් සයන්ස් ඇන්ඩ ටෙක්නොලොජි, කුමාසි

හොංකොං

හොංකොං විශ්ව විද්‍යාලය

ඉන්දියාව

සෙන්ටර් ෆෝ එන්වයර්මන්ට ප්ලෑනිං ඇන්ඩ ටෙක්නොලොජි අහමදාබාද්

මහාරාජා සයියජිරෝ විශ්ව විද්‍යාලය බැරෝඩා

ස්කූල් ඔෆ් ආර්කිටෙක්චර් ඇන්ඩ ප්ලෑනිං, නවදිල්ලිය

අයර්ලන්තය

යුනිවර්සිටි කොලේජ්, ඩබ්ලින් (ද නැෂනල් ඉන්ස්ටිටියුට ඔෆ් අයර්ලන්ඩ)

නවසීලන්තය

ඔක්ලන්ඩ විශ්ව විද්‍යාලය

සිංගප්පූරුව

ද ස්කූල් ඔෆ් ආකිටෙක්චර් ඇන්ඩ බිල්ඩිං, සිංගප්පූර් පොලිටෙක්නික් ආයතනය

ස්විට්සර්ලන්තය

ද ෆැකල්ටි ඔෆ් ආර්කිටෙක්චර්, ස්විස් ෆෙඩරල් ඉන්ස්ටිටියුට ඔෆ් ටෙක්නොලොජි

එක්සත් රාජධානිය

ආර්කිටෙක්චරල් ඇසෝසියේෂන්, ස්කූල් ඔෆ් ආර්කිටෙක්චර්, ලන්ඩන්

බාට්ලිට ස්කූල් ඔෆ් ආර්කිටෙක්චර් ඇන්ඩ ප්ලෑනිං, යුනිවර්සිටි කොලේජ්, ලන්ඩන්

බාත් යුනිවර්සිටි ඔෆ් ටෙක්නොලොජි

බ්‍රයිටන් පොලිටෙක්නික් ආයතනය

සිටි ඔෆ් ලිසෙස්ටර් පොලිටෙක්නික් ආයතනය

කොලේජ් ඔෆ් කැන්ටබරි

කොලේජ් ඔෆ් ආට ඇන්ඩ ඩිසයින්, බර්මින්හැම්

කොලේජ් ඔෆ් ආට, එඩින්බර්ග්

ඩිපාට්මන්ට ඔෆ් ආර්කිටෙක්චර්, ලිවර්පූල් පොලිටෙක්නික් ආයතනය

ඩිපාට්මන්ට ඔෆ් ආර්කිටෙක්චර්, සවුත් බෑන්ක් පොලිටෙක් ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම අධ්‍යයන පීඨය

ඩිපාට්මන්ට ඔෆ් ආකිටෙක්චර්, ද මැකින්ටෝෂ් ස්කූල්, ග්ලැස්ගෝ විශ්ව විද්‍යාලය

ඩිපාට්මන්ට ඔෆ් ජෝර්ඩන් ස්ටෝන් කොලේජ් ඔෆ් ආට, ඩන්ඩි

ෆැකල්ටි ඔෆ් ආර්කිටෙක්චර්, ආට ඇන්ඩ ඩිසයින්, හම්බර්සයිඩ කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන්

කිංග්ස්ටන් පොල්ටෙක්නික් ආයතනය, කිංග්ස්ටන් අපොන් තේම්ස්

ලීඩ්ස් පොලිටෙක්නික් ආයතනය

මැන්චෙස්ටර් පොලිටෙක්නික් ආයතනය

ඔක්ස්ෆර්ඩ් පොලිටෙක්නික් ආයතනය

සෙන්ට්‍රල් ලන්ඩන් පොලිටෙක්නික් ආයතනය

නෝර්ත් ලන්ඩන් පොලිටෙක්නික් ආයතනය

පෝර්ට්ස්මත් පොලිටෙක්නික් ආයතනය

ක්වීන්ස් විශ්ව විද්‍යාලය, බෙල්ෆස්ට

රීජනල් කොලෙජ් ඔෆ් ආට්, හල්

රොබට් ගෝර්ඩන්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි, ඇබර්ඩීන්

ස්කූල් ඔෆ් ආර්කිටෙක්චර් ෆැකල්ටි ඔෆ් ආට් ඇන්ඩ් සෝෂල් සර්විස් නෝර්ත් ඊස්ට් ලන්ඩන් පොලිටෙක්නික් ආයතනය

ස්කූල් ඔෆ් ආර්කිටෙක්චර්, හඩරස්ෆිල්ඩ් පොලිටෙක්නික් ආයතනය

ස්කූල් ඔෆ් ආර්කිටෙක්චර් ප්ලිමත් පොලිටෙක්නික් ආයතනය

ස්කූල් ඔෆ් එන්වයර්මන්ටල් ඩිසයින් රෝයල් කොලෙජ් ඔෆ් ආට්

ස්කොට් සදර්ලන්ඩ් ස්කූල් ඔෆ්ආර්කිටෙක්චර්

තේම්ස් පොලිටෙක්නික් ආයතනය

බ්‍රිස්ටල් විශ්ව විද්‍යාලය

කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය

වේල්ස් විශ්ව විද්‍යාලය, ඉන්ස්ටිටියුට් ඔෆ් සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි

එඩින්බර්ග් විශ්ව විද්‍යාලය

ස්ට්‍රැක් ක්ලයිඩ් විශ්ව විද්‍යාලය

ලිවර්පූල් විශ්ව විද්‍යාලය

ස්කූල් ඔෆ් එන්වයර්මන්ටල් ස්ටඩීස්, යුනිවර්සිටි කොලෙජ්, ලංඩන්

එක්සත් රාජධානිය

නිව්කාසල් අපොන්ටයින් විශ්ව විද්‍යාලය

නොටිංහැම් විශ්ව විද්‍යාලය

ෂෙෆීල්ඩ් විශ්ව විද්‍යාලය

ඇමරිකා එක්සත් ජනපදය

ඇමරිකා එක්සත් ජනපදයේ නැෂනල් කවුන්සිල් ඔෆ් ආර්කිටෙක්චරල් රෙජිස්ට්‍රේෂන් බෝඩ් (එන්සීඒආර්බී) විසින් පිළිගන්නා ලද සියලුම වාස්තු විද්‍යා ආයතන

රුසියානු සමූහාණ්ඩුව (රශියන් ෆෙඩරේෂන්)

මොස්කව් ඉන්ස්ටිටියුට් ඔෆ් ආර්කිටෙක්ස්

යුගෝස්ලාවියාව

සැග්‍රිබ් විශ්ව විද්‍යාලය

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.